# පුස්තකාල කළමනාකරණය

**එල්. ඒ. ජයතිස්ස**
B.Sc ( Sri Lanka ), PG. Dip. Lib ( Kel ).
M.L.I.Sc. ( Delhi )

## හැඳින්වීම

විසි එක් වන සියවසට ඉතා ම සමීප ව සිටින අපි "තොරතුරු" හෙවත් "විඥාපන" මූල සමාජයක ආරම්භයේ පසුවෙමු. විඥාපන තාක්ෂණය හා විදුලි සංදේශ තාක්ෂණය ද ලබා ඇති දියුණුව හේතුවෙන් තොරතුරු මාධ්‍ය, තොරතුරු ප්‍රචාරණය හා තොරතුරුවලට ප්‍රවේශය ද සාම්ප්‍රදායික මාර්ගයෙන් බැහැරව ගොස් විශාල වෙනස්කම්වලට පාත්‍ර වී තිබේ. අවට ලෝකයේ සිදු කෙරෙන මේ වෙනස්වීම්වලට ගැළපෙන පරිදි තොරතුරු මූලික ව ක්‍රියාත්මක වන පුස්තකාල ද අනුවර්තනය වීම අත්‍යවශ්‍ය වේ.

මෙහි ලා වැදගත් පියවරක් වනුයේ පුස්තකාල කළමනාකරුවන් ලෙස පුස්තකාලයාධිපතීන් විසින් ස්වකීය සේවා සංවිධානය පිළිබඳ ව විචාර පූර්වක ව සමාලෝචනයක්, අවශ්‍ය කෙටි කාලීන හා දීර්ඝ කාලීන වෙනස්කම්වලට කටයුතු කිරීමත් ය. පුස්තකාල වෘත්තිකයන් සඳහා පැවැත්වෙන අධ්‍යාපනික හා වෘත්තීය පුහුණු වැඩ සටහන් මේ ආකල්පමය වෙනසට මූල පිරීම සඳහා සුදුසු සංධිස්ථාන වේ.

කැලණිය විශ්වවිද්‍යාලයේත්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේත් පැවැත්වෙන පාඨමාලාවල පුස්තකාල කළමනාකරණය පිළිබඳ දේශකයකු ලෙස කටයුතු ‡ිරීමේ දී දේශන සටහන්වලට අමතර ව සිංහලෙන් පළ වූ පොත් පත හිඟය ගැන නොයෙක් විට සිසුන්ගේ අදහස් පළ කෙරුණු බැවින් මෙවන් කෘතියක් සම්පාදනය කළ යුතු ය යන අදහ ා ම සිත ඇති විය. මෙහි දී

කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල කළමනාකරුවන් විසින් භාවිත කරනු ලබන කළමනාකරණ සංකල්ප පිළිබඳවත් විඥාපන තාක්ෂණයේ ප්‍රගමනය හා එහි බලපෑම් මත පුස්තකාල වෘත්තියේ ඇති කෙරෙන අවශ්‍යතාත් ගැන කෙටියෙන් කරුණු ඉදිරිපත් කිරීමට මෙය අවස්ථාව කර ගතිමි.

දේශීය පුස්තකාල විද්‍යා සාහිත්‍යයේ ඇති අඩුව පිරිමැසීම මඟින් පුස්තකාල වෘත්තිකයන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම අරමුණු කර මේ කෘතිය සම්පාදනය කළෙමි. එය යම් තරමකට හෝ සඵල වන්නේ නම් මාගේ මේ කුළුඳුල් ව්‍යායාමය සාර්ථක වී යයි සතුටු විය හැකි ය. එබැවින් මෙහි ලා ඔබගේ ප්‍රතිචාරය ම වෙත දැන්වීම අගය කරමි.

එල්.ජී. ජයසිංහ

1999.02.08